**මුලටියන ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මුලටියන ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.7,452,745 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.153.461 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයට අදාළව 2022 වර්ෂයේදි ලැබී ඇති රු.989,819 ක වටිනාකම ලැබිය යුතු වෙනත් ආදායමට බැර කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි සංවර්ධනය කිරීමට වැය කරන ලද රු. 620,631 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | 2019 හා 2022 වර්ෂයේදී සභාවට ඉන්ධන ලබාගැනීමේදී ගෙවන ලද රු.500,000 ක ආරක්ෂක ඇප තැන්පත් ඉන්ධන වියදමට හිලව් නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී අදාළ මුදල ඉන්ධන තැන්පත් ගිණුමට මාරු කර ඉන්ධන බිල්පත්වලට හිලව් කරන තෙක් පවත්වා ගෙන යන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව ස්ථාපිත කර තිබූ සූර්ය පැනලය මගින් ජනනය වන විදුලිය අලෙවි කිරීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.608,237 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 161,104,352 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.94,548,665 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.567,814 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය | මාර්ගවල සලකුණු හා සීමා ලකුණු කර ඒවායේ නාම ලේඛනයක් පළකරනු ලැබිය යුතු වුවත් 2014 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොට්ඨාශ 08 ක අළුතින් හඳුනාගෙන තිබුණු මාර්ග 315 ක් ගැසට් මගින් ප්‍රසිද්ධියට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | GIS/GPS මෘදුකාංගය භාවිතා කරමින් දත්ත පද්ධතියක් සකස් කරමින් පවතින බවත්, ගැසට් නොකරන ලද මාර්ග පිළිබඳ තොරතුරු එක්රැස් කර සියළුම මාර්ග ගැසට් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.155,125 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 9,446,679 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,492,200 | 22,889 | 44,354 | 73,144 | 1,282,400 | 22,952 | 11,062 | 94,609 |
| (ii) | කුලී | 12,459,200 | 3,288,425 | 4,042,085 | 765,241 | 9,575,200 | 3,067,971 | 3,105,818 | 1,518,901 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 540,200 | 1,508,342 | 1,571,342 | 19,450 | 550,200 | 1,249,680 | 1,254,680 | 82,450 |
| (iv) | වෙනත් ආදායම් | 12,668,000 | 900,713 | 389,278 | 772,052 | 13,304,000 | 19,872 | 9,936 | 260,617 |
| | | 27,159,600 | 5,720,369 | 6,047,059 | 1,629,887 | 24,711,800 | 4,360,475 | 4,371,695 | 1,956,577 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යයසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව ප්‍රදේශයට අයත් දියුණු කළ ප්‍රදේශ 2022 පෙබරවාරි 11 දිනැති අංක 2267 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර සහා අනුමැතිය ලබා ගැනීම 2022 සැප්තැම්බර් 21 දින සිදු කර තිබුණද සමාලෝචිත වර්ෂය වන විටත් දේපල තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා ගෙන ඇති දෙයියන්දර නගරය ආශ්‍රිතව වරිපනම් බදු පැනවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ආණ්ඩුකාරවරගෙන් ඉල්ලීම් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාව සතු කඩ කාමර 68 න් 58 ක් බදු දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් බදුකරුවන් 35 දෙනෙකුගෙන් රු.694,714 ක කඩ කුලී අයවිමට තිබුණි. තවද එම හිඟ ශේෂය තුල වසා දමා තිබූ කඩ කාමර 10 ක් සඳහා වර්ෂ 2008 – 2013 කාල පරාසයට අදාළව කඩ කුලී බිල් කිරීම නිසා අය කර ගත නොහැකිව පවතින රු.318,850 ක කඩ කාමර කුලී ඇතුලත්ව තිබුණි. | එකඟ වන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | සභාව සතු වෙළඳ සංකීර්ණ තුනකට අයත් කාමර 32 ක නව තක්සේරු කඩකුලිය ඇතුළත් කර කඩ බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබූ අතර කඩ කාමර 14 ක මාසික කඩ කුලිය තක්සේරු කර යාවත්කාලීන කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බවත් නව තක්සේරු ඉල්ලීමක් කර ඇති බව. | ගිවිසුම්/ තක්සේරුව යාවත්කාලින කළ යුතු වේ. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු උසාවි දඩ රු.51,583ක් හා මුද්දර ගාස්තු රු.20,911,183 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 උප වගන්තිය ප්‍රකාර නාගරික නොවන බල ප්‍රදේශය තුල ගොඩනැඟිලි සැලසුම් හා ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම, ශ්‍රවණාගාරය කුලියට ලබා දීම හා සභාව සතු මුලටියන හා මාකඳුර ක්‍රීඩා පිටි කුලියට ලබා දීම යන කටයුතු සම්බන්ධයෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්පාදනය සම්බන්ධයෙන් මූලික කටයුතු සිදු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට සමාන බද්දක් අය කර යුතු වුවත් සභාව විසින් අවිධිමත් ලෙස ඉඩම් 03 කින් රු.470,000 ක අත්තිකාරම් ලබා ගෙන තිබුණි. | එකඟ වන බව . | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක PR/01/01 හා 2010 අගෝස්තු 17 දරන චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් රු.763,815 ක වියදම ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | එකඟ වන බව . | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සභා බල ප්‍රදේශයට අයත් නාගරික සීමාව තුළ සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව ඉදිකරමින් පැවති ගොඩනැගිලි 03 ක් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනයේ ප්‍රකාරව රු.854,400 ක ගාස්තු අයකර විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සැළසුම් කමිටු නිර්දේශය පරිදි නීති උපදෙස් ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | සභා බල ප්‍රදේශයට අයත් නාගරික නොවන සීමාව තුල සංවර්ධන බලපත්‍ර ලබා නොගෙන ඉදිකරමින් පැවති ගොඩනැගිලි 06 ක් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා එම ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සම්පාදනයට අදාලව මූලික කටයුතු සිදු කරමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථාවක් සකස් කර නාගරික නොවන සීමාව තුල ඇති අනවසර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාථමික සේවා කාණ්ඩයට අයත් තනතුරු 06 ක් සඳහා අනුමත සේවක සංඛ්‍යාව සම්පූර්ණ කර තිබියදීත් දෛනික හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 06 දෙනෙකු බඳවා ගෙන නියමිත රාජකාරී වලින් පරිබාහිරව රාජකාරී පවරා සමාලෝචිත වර්ෂය තුළ රු.2,234,086 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | ඉදිරියේදී එවැනි සේවක බඳවා ගැනීමක් සිදු නොකරන බව. | තනතුරට නියමිත රාජකාරිවල සේවකයන් යෙදවිය යුතු වේ. |